වැලි සෑය ඉදි කරවන මොහොතේ එහි හැඩය කොයි ආකාර වන්නේ දැයි මේසන් වඩුවාගෙන් විමසා ඇත. වඩුවා රන් බඳුනකට දිය පුරවා ඉන් දෝතක් අතට ගත් කල පබළු ඇටයක හැඩයට දිය බුබුලක් දිය මතුපිට හට ගත්තෙන්, ඒ මොහොතේ ඔහු රජු අමතා දාගැබ එම හැඩයට සාදන්නෙමි" යි පවසා ඇත.

අනුරාධපුරයේ ඇති අනිකුත් නටබුන් මෙන් සියළුම දාගැබ්ද හොඳින් වැඩුණු පලා වර්ග, ගස්, පඳුරු, ලිය වැල්, වලින් වැසී ගොස් ඇත. කාලයාගේ ප්‍රහාරයන්ට එරෙහිව දැඩි අධිෂ්ඨානයකින් යුතුව මිනිසා විසින් කරන ලද ගොඩ නැගීම් කෙතරම් නිෂ්ඵලදැයි, එමෙන්ම සොබා දහමේ නිහඬ බලවේගය කෙතරම් ශක්තිමත්දැයි කියා පාන්නාක් මෙනි. කලකට පෙර පක්ෂියෙකු අහසේ සිට හෙළන ලද බෝ ඇටයක් නුදුරෙහි ඇති පන්සලක් හෝ එහි කණුවක් මුදුනෙහි පතිත වී ඇත. එය එහි පැලවී කෙමෙන් කෙමෙන් ජලය සහ ආධාරකයක් සොයා ඇදුණි. පැලෑටියට කෙසේ හෝ එම නටබුන් වූ ගොඩනැගිල්ල මත වැඩෙන්නට අවශ්‍ය විය. එය එසේම සිදුවිය. සියවස් ගණනාවක් තිස්සේ එහි මුල් දැවැන්ත දාගැබ දෙපළු කරමින් එය වැඩුණි. දාගැබ් අවට සැතපුම් ගණනාවක ප්‍රදේශයක් පුරා ගෘහනිර්මාණයන්ගේ නටබුන් වලින් වැසී ඇත. ඉන් බොහොමයක්ම වෘක්ෂලතාවන්ගෙන් මුළුමනින්ම වැසී ඇත.

බොහෝ තැන්වල පොලොවේ පස ගඩොල් කුඩු වලින් රතු පැහැ ගැන්වී ඇත. ප්‍රතිමා හිස්, කුළුණු පාද, ගලින් තැනූ මිනී පෙට්ටි, අකුරු කෙටූ ගල් පතුරු, මී ගවයන්ගේ හෝ අලි ඇතුන්ගේ දළ රූ සටහන් සමඟ මිශ්‍ර ව තැනින් තැන විසිරී ඇත. ඒවායේ නිහඬ අසරණ භාවයට අවට ඇති වන ගහනේ සිටින අසංඛ්‍යාත වන සතුන්ගෙන් හා පිපාසිත කෘමීන් ගෙන් එල්ල වන විරෝධතාවය ඉතා අල්පය.

සතර දෙසින් පෙනෙන මේ දැඩි විනාශය දැක සතුටු වීමට අපට පුළුවන්කමක් නැත. ලංකාවේ තැනිතලා භූමියෙහි පවතින දේශගුණ තත්වය යටතේ ඉතා සරුසාර ලෙස වෘක්ෂලතාදිය වැඩීමට එතරම් කල් ගත වන්නේ නැත. දින කිහිපයක නොසැලකිල්ල නිසා එහා මෙහා යා නොහැකි වන පරිදි මංමාවත් වැසී යයි. සියවස් ගණනාවක කාල පරිච්ඡේදයක් ඉකුත් වීමෙන් පසු අනුරාධපුරයේ අද පවතින තත්වය ගැන අපට පුදුම විය හැකිද? නගරය සිහිනයක් මෙන් අතුරුදහන් වී ගොසිනි. එහි රාජ සභා වවුලන්ගේ වාසස්ථාන වී ඇත. මන්දිර වැලි දූවිලි හා මිශ්‍ර ව පවතී. එහි ඉබාගාතේ ගැවසෙන හිවලෙකුට එදා නගරයේ ජීවත්වූ, කා බී විනෝද වූ, දුකට පත්වූ හෝ මියගිය දස දහස් සංඛ්‍යාත ජනතාවගේ ඇට කටුවක් "හෝ සොයා ගැනීමට නැත. අති විශාල ප්‍රතිමාවන් එදා අති විශාල ජනකායක් සිය අබියස වැඳ නමස්කාර කරද්දී නිසලව සිටියාක් මෙන්ම අදත් ඔවුන්ගේ පාෂාණමය මුහුණුවල මිහිපිට නොවන ආකාරයේ හිස් බැල්මක් රඳවා ගෙන ඒ ආකා රයෙන්ම සිටී. මහා දාගැබ් අදත් එදා මෙන්ම නිල් මැණික් අහස දෙපළු කරමින් සිය වියපත් සෙවනැලි මිහි මත හෙළමින් සිටී. නමුත් ඒවා පසුපස තිබූ දෑත් අද කොහිද? දහවලේ දැවෙන හිරු එළියේ ඒවායේ සෙවනේ පිහිට පැතූ ඔවුන් අද කොහිද? ගෙවුණු වසරේ වැටුණු හිම අද කොහිද?

(සිරීපා අඩවිය පිළිබඳ තොරතුරු ලබන කලාපයේ.)

පරිවර්තනය ශ්‍රියා කුමාරසිංහ

*"You'll never plow a field by turning it over in your mind."*



## විචාරය

අධිනීතිඥ ලක්ෂ්මන් වැලිවිටිය.

# පියවි ඇසින්

මාර්තු 26 වන දින අළුයම එල්.ටී.ටී.ඊ. ය විසින් තම ප්‍රථම ගුවන් හමුදා ප්‍රහාරය ගුවන් හමුදා මූලස්ථානයට එල්ල කළේය. කොටි සංවිධානයේ ප්‍රකාශක රාසයියා ඉලෙන්තේරියෙන් ප්‍රකාශ කර තිබුණේ ''අති සාර්ථක ප්‍රහාරයකින් පසු විමුක්ති කොටි ගුවන් නියමුවන් නිරුපද්‍රිතව කිලිනොච්චිය බලා පැමිණි බවයි.'' තමිල්නාඩුවේ ද්‍රවිඩ දේශපාලන නායකයෙකු වන පී. නැදුමරන් ප්‍රකාශ කර සිටියේ ''එල්.ටී.ටී.ඊ. විමුක්තිකාමීන් විසින් එල්ල කළ ගුවන් ප්‍රහාරය ලෝකයේ සතර දිග් බාගයේ වෙසෙන සියලුම දෙමලුන් වෙත සීමා රහිත ප්‍රීතිය හා සන්තෝෂය ගෙන ආ බවයි.'' එමෙන්ම දෙස් විදෙස් සිටි සියලු සිංහලයෝ තම තමන් විසින්ම පත් වූ අසීමිත ලැජ්ජාවටත්, නින්දාවටත් පත්වූහ.

මොහොතක් ගොළු වී, සැලී සිටි ආණ්ඩුව තමන්ගේ පොදු අවස්ථාවාදයට පෙරසේම නැඹුරු වීය. මෙම පහරදීමට මංගල සමරවීර හා ශ්‍රීපති සූරියආරච්චි වගකිවයුතු බව අනුර ප්‍රියදර්ශන යාපා සහ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ පැවසූහ. මෙය කෙතරම් බංකලොත් ප්‍රකාශණයක් ද? පසුදින පැවති පක්ෂ නායක රැස්වීමේදී ජනාධිපතිවරයා විසින් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයට එරෙහිව මුණදීමට පටුදේශපාලන භේද වලින් තොරව සියලුදෙනා එක්වන සේ ආයාචනා කළේය. නමුත් ඔහු ප්‍රධානතම විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂයට හෝ රටේ විපක්ෂ නායකවරයාට ඒ රැස්වීම සඳහා ආරාධනා නොකළේය. එයින් නොනැවතී එ.ජා.ප.යට ආරාධනා කළ බවට ජනාධිපති කාර්යාලය විසින් අසත්‍ය නිවේදනයක් ද නිකුත් කරන ලදී. ආරම්භයේ සිටම මිග් යානා හෝ කෆීර් යානා විනාශ කිරීමට නොහැකි වූ බව පවසමින් ප්‍රහාරය අවම කිරීමට රජය උත්සාහ ගත්තේය. නමුත් ප්‍රධාන කාරණය ගුවන් ප්‍රහාරය මිස ඒ ප්‍රහාරය මගින් සිදුකළ හානිය නොවේ යැයි මධ්‍යස්ථ විචාරකයෝ පැවසූහ. එමෙන්ම විපක්ෂ නායකවරයා මෙම අවස්ථාවේ බැරෑරුම් ස්වභාවය සලකා පාර්ලිමේන්තුව කැඳවන ලෙස ඉල්ලා සිටි මුත්, අගමැතිවරයාගේ ප්‍රකාශය වූයේ බෝම්බ පුපුරණ ගානට පාර්ලිමේන්තුව කැඳවිය නොහැකි බවය. මෙම සිද්ධියේ බරපතලකම අගමැතිවරයා තක්සේරු කලේ එසේය. විපක්ෂ නායකවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කර සිටියේ ආරක්ෂක ඇමැතිවරයාගේ සිට ගුවන් හමුදාපති දක්වා කිසිවකු මෙම ජාතික අපරාධයේ වගකීම භාර ගෙන නොතිබීම කණගාටුවට කරුණක් බවය. එසේම ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීවරයා, ගෝඨාභය රාජපක්ෂ මෙම මොහොතේ ආරක්ෂක තත්ත්වය කඩා වැටීමට සෘජුවම වගකිව යුතු බව ප්‍රකාශ කළේය.

එහෙත් ආණ්ඩුව කියා සිටියේ මෙම තත්ත්වයට සාම ගිවිසුම වගකිව යුතු බවයි. එසේම සඳහන් කළ යුතු වැදගත් කරුණ වන්නේ, ගෝඨාභය රාජපක්ෂ ඝාතනය කිරීමට උත්සාහ ගත් අවස්ථාවේදී එල්.ටී.ටී.ඊ.ය තහනම් කරන ලෙස හඬ නැගූ ජ.වි.පෙ. හා හෙළ උරුමය මෙම බැරෑරුම් අවස්ථාවේදී එල්.ටි.ටි.ඊ. ය තහනම් කිරීම පිළිබඳව කිසිඳු හඬක් නොනැගුවේ මන්ද යන්නයි.

''කණගාටුවට කරුණ පහරදීමට නොව

> *ඉන්දියානු ආරක්ෂක විශේෂඥයකු වන බී. රාමන්ගේ මතය අනුව වසර 9ක් තරම් කාලයක් තිස්සේ සැහැල්ලු ගුවන්යානා කිහිපයක් එල්.ටි.ටි.ඊ. ය සතුව තිබෙයි. මෙම ප්‍රකාශයන් සත්‍ය නම් රජය හා රහස් ඔත්තු සේවාවන් නිවැරදිව ඒ පිළිබඳව ජනතාව දැනුවත් කල යුතුව තිබූ අතර, ඕනෑම පහරදීමකට සූදානම්ව සිටිය යුතුව තිබුණි.*

පහරදීමෙන් පසුව එල්.ටී.ටී.ඊ. ගුවන් යානයට නිරුපද්‍රිතව කිලිනොච්චියට යාමට ඉඩදීම යයි'' සාගර රත්නායක මන්ත්‍රීවරයා පැවසීය. පෙරළා පහරදීම සඳහා ගුවන් යානයක් පසුපස යවන්නට බැරි වූයේ ඇයි දැයි'' ඔහු ප්‍රශ්න කර සිටියේය. ඇත්ත වශයෙන්ම මෙම කරුණ සියලු ලාංකිකයන් විසින් ඇසිය යුතු ප්‍රශ්නයකි. 2006 දෙසැම්බර් 9 වන දා ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධාන ඩොනල්ඩ් පෙරේරා ප්‍රකාශ කර තිබුණේ ''එල්.ටී.ටී.ඊ. යට තනි ඇන්ජිමේ කුඩා ගුවන්යානා දෙකක් තිබෙන බවත්, ඔවුනට ගුවන් ප්‍රහාරයක් එල්ල කිරීමට හැකියාවක් නැති බවත්ය.'' ඔහු කල අසත්‍ය ප්‍රකාශයට ඔහු වගකීම භාර ගන්නේද? ප්‍රශ්නය ඔහු හමුදා තුනටම නායකත්වය දෙන මෙහෙයුම් අණදෙන නිලධාරියාවීමය.

ලෝකයේ ප්‍රථම වතාවට රටකට විඳීමට සිදුවූ මහත් අවමානයකට ලංකාව පත් වුයේය. නමුත් මෙම කාරණය අරභයා මෙතෙක් වගකිව යුතු වුවෙකු හෝ වගකීම භාරගත්තෙකු හෝ ඒ සඳහා දඬුවම් විදි කෙනෙක් නැත. ප්‍රසිද්ධ ආරක්ෂක විචාරකයකු වන ඉක්බාල් අතාස් කියන ආකාරයට තිබෙන සැහැල්ලු ගුවන්යානා සංඛ්‍යාව 5 කි. ඉන්දියානු ආරක්ෂක විශේෂඥයකු වන බී. රාමන්ගේ මතය අනුව වසර 9ක් තරම් කාලයක් තිස්සේ සැහැල්ලු ගුවන්යානා කිහිපයක් එල්.ටි.ටි.ඊ. ය සතුව තිබෙයි. මෙම ප්‍රකාශයන් සත්‍ය නම් රජය හා රහස් ඔත්තු සේවාවන් නිවැරදිව ඒ පිළිබඳව ජනතාව දැනුවත් කල යුතුව තිබූ අතර, ඕනෑම පහරදීමකට සූදානම්ව සිටිය යුතුව තිබුණි. රාජ්‍ය මාධ්‍ය ප්‍රකාශකයන් දෙස් විදෙස් ගුවන්විදුලි හරහා ගිරව් මෙන් ආරක්ෂාව සඳහා කුමන සහතික දුන්නද ඉන්දියාවේ 'ද හින්දු' පුවත්පතෙහි මෙම සිද්ධියේ බැරෑරුම් බව පැහැදිලි කර තිබුණේ මෙසේය. ''කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපල අසල පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය ඉලක්ක කර ගනිමින් එල්.ටී.ටී.ඊ.ය විසින් ප්‍රථම වරට කළ ගුවන් ප්‍රහාරය යුද ගැටුමට මැදි වී සිටින ශ්‍රී ලංකාව තුළ ඇති වූ බිහිසුණු වර්ධනයකි. එමගින් දැන් පවතින ආරක්ෂා වාතාවරණය තවදුරටත් පිරිහීමට ඉඩ සැලසෙනවා පමණක් නොව, ත්‍රස්තවාදයට එරෙහි සටනේදී මුහුණපෑමට සිදුවී ඇති නව අභියෝගයක් ද වන්නේය. එය දැනට පවතින අප්‍රකාශිත යුද්ධය අනතුරුදායක අවස්ථාවකට ප්‍රවිෂ්ඨ වී ඇති බව පැහැදිලිය. වඩාත් ත්‍රාසජනක මතය වන්නේ කොටි සංවිධානයේ විස්මිත ප්‍රහාරයෙන් කොළඹ ප්‍රදේශයේ ආරක්ෂක සූදානමේ පවතින දුර්වලතාවය ඉස්මතුවීමය. මෙහි සැබෑ තත්ත්වය වන්නේ ගුවන්යානා එකක් හෝ දෙකක් උතුරේ වන්නි කැලයෙන් ගුවන්ගත කොට කිලෝමීටර් 4000 ක් දුර ගෙවා පැමිණි ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බෝම්බ හෙලීමෙන් අනතුරුව පැය දෙකක පමණ කාලයක් ගුවනේ සැරිසරා කිසිදු අභියෝගයකට මුහුණ නොදී කොටි සංවිධානය ගුවන් හමුදා කඳවුරක් ලෙස හඳුන්වන තැනට ආපසු ළඟාවීමයි.'' යනුවෙනි. මෙය තිස් වසරක යුද්ධයේ අපගේ තත්ත්වයයි.

මෙහිදී මා මතු කරන යථාර්ථය වන්නේ මේ පහරදීම හෝ ඒ සම්බන්ධයෙන් ඉහත දැක්වූ මති මතාන්තර පිළිබඳව විවේචනය කිරීම නොවේ. සමස්ථයක් ලෙසින් ලංකාවේ ආණ්ඩු (මෙම ආණ්ඩුව පමණක් නොවේ) යුද්ධය පිළිබඳව හෝ ප්‍රශ්ණයේ සැබෑ ස්වරූපය පිළිබඳව කිසිඳු මානයකින් හෝ හැඟීමකින් කටයුතු නොකර ඇති බවය. මෙම ප්‍රශ්නය අරඹයා, විසඳුම් දෙකක් කරමත ලා ගෙන ලාංකිකයන් පොර බදති.

1. මෙම ප්‍රශ්නයට යුද්ධමය විසඳුමක් අවශ්‍ය බවය.
2. බලය බෙදීම මේ සඳහා වන විසඳුම බවය.

යුද්ධය විසඳුම නම්, එල්.ටී.ටී.ඊ. විසින් ශ්‍රී මහා බෝධියටද, දළදා මාලිගාවටද, ජාත්‍යන්තර ගුවන්තොටුපලටද, ප්‍රධාන තෙල් සංකීර්ණයටද, ලෝක ආර්ථික වෙළෙඳ මධ්‍යස්ථානයටද, මහා බැංකු ගොඩනැගිල්ලටද, හමුදාපති මූලස්ථානයේදී හමුදාපතිටද, දැන් ගුවනින් ගුවන් හමුදා මුලස්ථානයටද පහර දී ඇත. මේ අනුව රටේ වැදගත්ම ස්ථාන පහරදීම්වලට ගොදුරු වී ඇත. ■